FACULTY OF GRADUATE STUDIES
24 MAY 2011
UNIVERSITY OF KELANIYA

# ගම්පොළ යුගයේ කල්පිත සත්ත්ව රූප ආශ්‍රයෙන් කෙරෙන ඓතිහාසික හා සංස්කෘතික අධ්‍යයනයක්

එච්. එම්. එස්. මනෝරංජන හේරත් බණ්ඩාර
B.F.A. (කැලණිය), M.F.A. (දිල්ලි)

දර්ශන විශාරද (Ph.D) උපාධි පර්යේෂණ නිබන්ධය

2011 - ජනවාරි

කැලණිය විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 666 |
| වර්ග අංකය | |

## සාර සංග්‍රහය

ගම්පළ රාජධානිය ලාංකේය කලා ඉතිහාසයේ ඉතා වැදගත් කාල පරිච්ඡේදයක් වන අතර එය දෘශ්‍යකලා ක්ෂේත්‍රයෙහි ලා විශේෂ නිර්මාණ සංකල්ප හඳුන්වා දුන් යුගයකි. එහි දී කාල්පනික සත්ත්ව රූප සංකල්ප රාශියක් කලාව හා එකතුවීම විශේෂත්වයක් ගනියි. මෙම විශේෂත්වය ගම්පළ යුගයේ කලාවෙහි දැකිය හැකි වන්නේ කවර හේතු සාධක මත ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ විය. එහි දී කාල්පනික සත්ත්ව රූප රචනාවන්ගේ ප්‍රභවය කෙරෙහි බලපෑ සාධක කවරේ ද යන්න විමර්ශනය කිරීමත්, මෙම නිර්මාණයන්හි කලාත්මක අගය පිළිබඳ ව නිශ්චය කිරීමත් අවධාරණය කෙරිණි. ගජසිංහ, කිඳුරා, භේරුණ්ඩ පක්ෂියා, ඇත්කඳලිහිණියා හා ශැරපෙන්දියා යන කාල්පනික සත්ත්වරූප රචනාවන්හි ප්‍රභවය, සංකල්පාර්ථ හා කලාත්මක අගය සම්බන්ධයෙන් අවධානය යොමු කෙරිණි.

මෙහි පළමු පරිච්ඡේදය මගින් විශ්ව මානව ශිෂ්ටාචාරයේ සංවර්ධනය හා සත්ත්ව රූප භාවිතය පිළිබඳ ව දළ විග්‍රහයක් ඉදිරිපත් කෙරෙන අතර ශ්‍රී ලාංකේය කලාවේ සත්ත්ව රූප භාවිතය සම්බන්ධයෙන් ද අධ්‍යයනය කොට ඇත. එමඟින් සත්ත්ව රූප හා මානව සංස්කෘතිය අතර වූ සබැඳියාව විශ්ලේෂණය කෙරිණි.

දෙවන පරිච්ඡේදය මඟින් ගම්පළ රාජධානියේ ඓතිහාසික දේශපාලනික හා ආගමික පරිසරය පිළිබඳවත්, තත්කාලීන සාහිත්‍ය හා අනෙකුත් කලා භාවිතයන් සම්බන්ධයෙන් විමර්ශනය කොට ඇත. එමඟින් පර්යේෂණයට බඳුන් වන කාලපරිච්ඡේදයේ සමාජ, සංස්කෘතික පසුබිම මැනවින් හඳුනාගත හැකි වේ.

ගම්පළ යුගයට අයත් තෝරාගත් ගොඩනැගිලි හා ඒවායේ ඇති වාස්තු විද්‍යාත්මක ලක්ෂණ විමර්ශනය කොට මූර්තිමය නිමැවුම් එහි ලා කෙතරම් වැදගත් වී ද යන්න විමසීම තෙවන පරිච්ඡේදය මඟින් සිදු විය. එමඟින් කාල්පනික රූප නිර්මාණ සඳහා එම අවකාශයෙහි ලැබුණු ස්ථානය කවරාකාර ද යන්න විමසන ලදි.

කාල්පනික සත්ත්ව රූප සංකල්ප පිළිබඳ ව පවත්නා ශාස්ත්‍රීය මතවාද විමර්ශනය කරමින් ලාංකේය කාල්පනික රූප නිර්මාණයන්හි ප්‍රභවය සම්බන්ධ ව අධ්‍යයනය කොට ඒවා වර්ගීකරණයට ලක් කිරීම සිව්වන පරිච්ඡේදය මඟින් සිදු විය.

මෙහි පස්වන පරිච්ඡේදය මඟින් ගම්පළ යුගයේ භාවිත වූ ප්‍රධාන කාල්පනික සත්ත්ව රූප පහක් සම්බන්ධයෙන් අධ්‍යයනය කළ අතර ඒවායේ කලාත්මක අගය සම්බන්ධයෙන් ද සාකච්ඡා කොට ඇත. මේ එක් එක් සත්ත්ව රූපයනට අදාළ දෘශ්‍ය සාධක මඟින් එම සංකල්ප පැහැදිලි කෙරිණි.

පොදුවේ මේ සියලු කාල්පනික සත්ත්ව රූප කෙරෙහි දක්ෂිණ භාරතීය කලාවේ ආභාසයත්, එම ශිල්ප ශාස්ත්‍රීය දැනුම ද, ආගමික සංකල්ප ද බලපා ඇති බව පැහැදිලි වන අතර, අතිරේකව මැත පෙරදිග කලාවේ (Ancient Near East) හා ඉස්ලාමීය කලා අංගයන්ගේ ආභාසයෙන් පෝෂණය වී ඇත.